## පළමුවන දේව ප්‍රකාශනය

ජෙරමියා 33:14-16

ජෙරමියා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**"දාවිත් පරපුරෙන් දැහැමි උතුමකු නැගිටුවන්නෙමි."**

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: "ඉශ්‍රායෙල් සෙනගටත් ජුදා සෙනගටත් මා කළ පොරොන්දුව ඉෂ්ට කරන කාලය පැමිණෙන්නේ ය. ඒ දවස, ඒ අවදිය පැමිණි විට සැබෑ ලෙස දාවිත්ගේ පරපුරෙන් පැවත එන දැහැමි උතුමෙකු මම නැගිටුවන්නෙමි. එතුමාණෝ දේශය මුළුල්ලේ සාධාරණව, යුක්ති සහගතව කටයුතු කරන සේක. ඒ කාලය පැමිණි විට ජුදාහි වැසියෝ ගළවනු ලබන්නෝ ය. ජෙරුසෙලම් වැසියෝ ද සුව සේ වාසය කරන්නෝ ය. ඔවුන් සිය දේශයට දෙන නාමය "සමිඳාණන් වහන්සේ අපේ මිදුම්කාරයාණෝය" යනුයි.''

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 25:4-5, 8-9, 10, 14

පිළිතුර: ඔබ වෙත සමිඳුනි, මා හදවත ඔසවමි.

ගීය: සමිඳුනි, ඔබේ ක්‍රියා මාර්ගය මට හෙළි කළ මැනව. ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව. ඔබේ සත්‍යය අනුව මා ගෙන ගිය මැනව. මට එය ඉගැන්වුව මැනව. මන්ද, ඔබ මාගේ විමුක්තිදායක දෙවිඳාණෝ ය. දවස පුරා ඔබ එන මඟ බලා සිටිමි.

සමිඳාණෝ යහපත් ය. අවංකය. එතුමාණෝ පව්ටුන් හට යා යුතු මාර්ගය උගන්වන සේක. එතුමණෝ නිහතමානී අය යුක්තියෙහි හසුරු වන සේක. එතුමණෝ යටහත් පහත් අයට තම මාර්ගය උගන්වන සේක.

හිමි තුමන්ගේ ගිවිසුම හා ශික්ෂා පද පිළිපදින අයට එතුමන්ගේ සියලු මාවත් කරුණාවේ හා සත්‍යයේ මාවත් වනු ඇත. හිමි තුමන්ගේ රහස් සැලැස්ම එතුමාණන් කෙරේ ගරුබිය දක්වන අයට පෙන්වා ඇත. එතුමාණන් ස්වකීය ගිවිසුම ඔවුන්ට දන්වා ඇත.

## දෙවන දේව ප්‍රකාශනය

1 තෙසලෝනික 3:12-4:2

පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**("ක්‍රිස්තුස් වහන්සේ පැමිණෙන කල ඔබගේ හදවත ශුද්ධවත් භාවයෙන් ශක්තිමත් කරන සේක.")**

අප ඔබට ප්‍රේම කරන්නාක් මෙන් ස්වාමින් වහන්සේත් ඔබ එකනෙකා කෙරෙහිත්, අන් සියල්ලන් කෙරෙහිත්, ඔබගේ ප්‍රේමය පිරී ඉතිරී යන්නට සලස්වන සේක්වා! අපගේ ස්වාමින් වන ජේසුස් වහන්සේ සිය සැදැහැවතුන් සමග වඩින විට, ඔබගේ සිත් අපගේ දෙවි පියාණන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධව ද, නිදොස්ව ද තිබෙන ලෙස ශක්තිමත් කරන සේක්වා! සහෝදරවරුනි, දෙවියන් වහන්සේ ප්‍රසන්න කිරීමට කෙසේ හැසිරිය යුතුදැයි ඔබ අපගෙන් ඉගෙනගත්තහු ය. ඔබ එසේ හැසිරෙන්නහු ය. එහෙත් ඔබ වැඩි වැඩියෙන් එසේ කරන ලෙස, අපි සහකාර කිතුනුවන් වශයෙන් ඔබගේ ඉල්ලා අවවාද කරමු. ජේසුස් ස්වාමින් වහන්සේගේ නාමයෙන් අපි ඔබට කුමන අවවාද අනුශාසනා දුනිමු දැ යි ඔබ දන්නහු ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ගීතාවලිය 85:7

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ තිර පෙම අපට පෙන්නුව මැනව.
ගැළවීමේ පිහිට අපට ද දානය කළ මැනව.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 21:25-28, 34-36

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("ඔබේ විමුක්තිය ළඟා වන්නේය.")**

"හිරු, සඳු හා තාරකා වල ලකුණු පහළ වන්නේය. මුහුදේ හා රළ පතරෙහි ඝෝෂාවෙන් වන වියවුලින් ජාතීන් හට සිත් වේදනා වන්නේය. අහසේ බලවේගයන් සොළවනු ලබන බැවින් ලෝකයට සිදු වන්න යන ආපදා ගැන බලා සිටීමෙන් මිනිසුන්ගේ සිත් බියෙන් ක්ලාන්ත වන්නේය. එකල මනුෂ්‍ය පුත්‍රයාණන් බල පරාක්‍රමයෙන් ද මහා තේජශ්‍රීයෙන් ද වළාකුළක් මත වඩිනු ඔවුහු දකින්නෝය.

මේ දේ සිදුවන්න පටන්ගන්නා කල ඔබේ විමුක්තිය ළං වේගන එන බැවින් නැඟී සිට හිස ඔසවන්නැ" යි වදාළ සේක. "ඒ දවස මලපතක් මෙන් හදිසියෙන් ඔබ අසුකර නොගන්නා පිණිස කම්සැපෙන් ද බීමත්කමෙන් ද මේ ජීවිතයේ කරදර වලින් ද ඔබේ සිත් නොවෙහෙසෙන හැටියට බලාගන්න. මන්ද එය මුළු පොළවෙහි සකළ ලෝක වාසීන් පිට පැමිණෙන්නේය. එබැවින් ඒ සිදුවන ආපදා සියල්ලෙන් ජයාන්විතව ගැලවෙන පිණිස ද මනුෂ්‍ය පුත්‍රයාණන් ඉදිරියෙහි පෙනී සිටින පිණිස ද අයැදිමින්, හැමවෙලේම අවදිව සිටින්න."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.